# පරමාකන්ද රජ මහා විහාරයේ සංස්කෘතික උරුමය පිළිබඳ අධ්‍යයනයක්

පී.ජී.එච්.එල්. සඳරුවන්

සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
harshalakmal814@gmail.com

**මුඛ්‍ය පද :** පරමාකන්ද, පුරාවිද්‍යා, බිතුසිතුවම්, ලෙන් විහාර, සෙල්ලිපි

**හැඳින්වීම**

ලංකාවේ පැරණි වාස්තුවිද්‍යා සම්ප්‍රදාය තුළ ලෙන් විහාරවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙරට පැරණි මෙන්ම ප්‍රධාන වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස ගල්ලෙන් හඳුනාගත හැකි අතර පරමාකන්ද රජ මහා විහාරය ඓතිහාසික ලෙන් විහාර සංකීර්ණයක් ලෙස හඳුනාගත හැක. පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව මැතිවරණ කොට්ඨාසයේ, කුමාර වන්නි පළාතේ, පේරවිල පත්තුවේ, පරමාකන්ද නම් ග්‍රාමයට අයත්ව මෙම ලෙන් විහාරය පිහිටා තිබේ. මෙම විහාර භූමිය තැනිතලා භූමියක් මත නිර්මාණය වූ හුදෙකලා ගල් පර්වතයකි. මහින්දාගමනයෙන් පසුව බහුල වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා රට පුරා ගල්ලෙන් නිර්මාණය කොට පූජා කළ අතර ආණමඩුව පරමාකන්ද රජමහා විහාරයේ ලෙන් සංකීර්ණය ද ඒ අතර වැදගත් වේ. වර්තමානය වනවිට මෙහි ලෙන් විහාර හයක් පමණක් දැකගත හැක. පර්වත වළල්ලේ උඩ කොටසේ ප්‍රධාන ලෙන් විහාරය පිහිටා තිබෙන අතර ඉන් 4ක් දක්නට ලැබෙන්නේ එම පර්වත වළල්ල තුළ යි. තෝනිගල සෙල්ලිපියේ දැක්වෙන පරිදි වළගම්බා රජ සමයේ දී මහාතිස්ස නම් හිමිනමක් විසින් පරමාකන්ද විහාරය ගොඩනංවා ඇත. පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ අවධියේ ලෙන් විහාර දෙකක් පිළිසකර කොට තිබේ. මෙම විහාරස්ථානය සංස්කෘතික වටිනාකම් රැසකින් යුක්ත විහාරස්ථානයක් වුව ද ඒ පිළිබඳව විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු කොට නොමැති පසුබිමක මෙම විහාරයේ සංස්කෘතික උරුමයෙහි ඇති සුවිශේෂීතාවයන් කවරේදැයි යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී විහාරයේ ඇති සෙල්ලිපි, බිතුසිතුවම්, ලෙන් විහාර, පෙති උළු සෙවිලි කළ පංචායතන ක්‍රමයට ඉදිකළ සංඝාවාසය, සිරිපතුල් සංකේත, ස්ථූප හා විහාරස්ථානයේ දක්නට ලැබෙන නටඹුන් පිළිබඳ අවධානය යොමු කරන ලදී. අනුරාධපුර මුල් යුගයේ සිට පැවත එන සංස්කෘතික උරුමයන් හා මහනුවර යුගයේ අවසාන භාගය දක්වා පුරාවිද්‍යාත්මක සාධක ගණනාවක් විසිරී ඇති මෙම ලෙන් විහාර සංකීර්ණයේ සංස්කෘතික උරුමයන් පිළිබඳව තොරතුරු ලේඛනගත වී නොතිබීමත් ලේඛනගත වී ඇති තොරතුරු ඉතා අල්ප බවත් හේතුකොටගෙන විහාරයේ සංස්කෘතික උරුමයන් පිළිබඳව විධිමත්ව අධ්‍යයනය කරමින් හඳුනාගන්නා තොරතුරු ලේඛනගත කිරීම හා ඓතිහාසික යුග කිහිපයක වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අංගයන්හි විශේෂිත ලක්ෂණ හඳුනාගැනීම මෙහි අරමුණයි.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම පර්යේෂණ ගැටලුව සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගෙන ඇත. ඒ යටතේ පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම යන ක්‍රමවේදයන් ඔස්සේ එක්රැස් කරගන්නා දත්ත ඓතිහාසික ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

රජරට රාජධානියට අයත් ප්‍රත්‍යන්ත වයඹදිග තැනිතලා භූමියේ දැකුම්කළු පරිසරයක පිහිටියා වූ පරමාකන්ද රජමහා විහාරය අනුරාධපුරයෙන් ආරම්භ වී නූතන යුගය දක්වා ම ක්‍රමිකව සංවර්ධනය වූ සංස්කෘතිමය අතින් පොහොසත් විහාරස්ථානයකි. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මකව වැදගත් නටඹුන් රාශියක් මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන

අතර විජය කුවේණි කතා පුවතට සම්බන්ධ ඓතිහාසික මූලාශ්‍ර මෙන්ම ජනප්‍රවාද රාශියක් මේ ප්‍රදේශයේ ප්‍රචලිතව පවතී. මෙම ප්‍රදේශය පිළිබඳව ඇති අනෙක් මූලාශ්‍ර නිසි ගවේශනයක් නොකිරීමෙන් ලාංකේය ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයක් තවමත් මේ මහ පොළොව යට නිධන්ගත වී ඇත. මෙම විහාරයේ උඩ මළුව, පහළ මළුව, රහත්ගල හා ඔරුගල යන ස්ථාන තුළ මෙන්ම විහාර භූමියෙන් පිටත පවා සංස්කෘතික උරුමයට අදාළ සාධක ගණනාවක් හමුවේ. ස්පර්ශිත උරුමය පමණක් නොව අස්පර්ශිත උරුමයට අදාළ සාධක හා තොරතුරු ද මෙම ඓතිහාසික රජ මහා විහාරය තුළින් හමුවේ. මෙහි ඇති ප්‍රධාන ලෙන් විහාරය පළල අඩි 30-40ක් තරම් පුළුල් ස්වභාවයක් ගන්නා අතර උසින් අඩි 100-150 තරමකට උසකින් යුක්ත ලෙන් විහාරයක් බව හඳුනාගත හැක. ලෙන් විහාරය පුරා ම කටාරම් කොටා ඇති අතර මහනුවර යුගයේ සිතුවම් දක්නට ලැබෙන්නේ ද මෙම ලෙන් විහාරය තුළයි. විහාරයේ ස්තූප ත්‍රිත්වයක් පැවති අතර එයින් ස්තූප දෙකක් පැහැදිලිව ම දැකගැනීමට හැකිවන අතර අනෙක් ස්තූපය ලෙන් විහාරයේ උස ම පර්වත මුදුනෙහි නටඹුන් පමණක් ඉතිරිව තිබේ. දඹදෙණිය යුගයේ ඉදිකළ පැරණි ස්තූපය මත ලෙන් විහාරය තුළ දක්නට ලැබෙන ස්තූපය ගොඩනගා ඇති අතර අනෙක් ස්තූපය විහාරස්ථානයේ ඔරුගල නම් ගල් පර්වතය තුළ ඉදිකොට තිබේ. එය වර්තමාන ඉදිකිරීමක් වශයෙන් පෙන්වාදිය හැක. මෙහි පැරණි සංඝාවාසය මහනුවර යුගයේ ආකාරයට පෙති උළු සෙවිලි කර තිබේ. එහි ලී කණු, උළුවහු හා දොරවල් වර්තමානයේ ශේෂව ඇත. ප්‍රධාන පර්වත ලිපි දෙකක් සහ ලෙන් පූජාවන් ගැන සඳහන් ලෙන්ලිපි හයක් මෙම විහාරය සතුය. අනුරාධපුර, දඹදෙණිය, මහනුවර යුගවල දී මෙම විහාරයේ ඉදිකිරීම් සිදුකර ඇති බවට සාක්ෂ්‍ය සපයමින් "සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය", "වෙස්සන්තර ජාතකය" ඇතුළුව තවත් මහනුවර යුගයේ ලක්ෂණ ඉස්මතු වන සිතුවම් කිහිපයක් ම පරමාකන්ද රජමහා විහාරයේ ලෙන් ආශ්‍රිතව අද්‍යාතනය තෙක් ශේෂව පවතී. මේවායේ කහ වර්ණය ඉතා අඩු මට්ටමකින් භාවිතා කොට ඇත. එලක 01 මගින් මෙම විහාරයේ සිතුවමක් පෙන්වා දී ඇත.



එලක 01 මහනුවර යුගයේ ලක්ෂණ
ඉස්මතු වන සිතුවමක්

පර්යේෂණය අවසන හෙළිදරව් කරගන්නා ලද තොරතුරු හා සාධකවලට අනුව වෙස්සගිරිය ලෙන් විහාරයේ ආකාරයට මෙම ලෙන් විහාර තුළ ද යම් බදාමයක් ආලේප කොට සිතුවම් ඇඳ තිබීමෙන් අනුරාධපුර යුගයේ සහ ලෙන් අභ්‍යන්තරයේ දැක්වෙන සිතුවම්වලට අනුකූලව මහනුවර යුගයේ ලක්ෂණ ඉස්මතු වේ. එනයින් තහවුරු කොටගත හැකි කරුණක් නම් පුරාවිද්‍යාත්මක උරුමයන්ගෙන් හෙබි පරමාකන්ද රජ මහා විහාරය ලංකාවේ රාජධානි ආරම්භක යුගයේ සිට ම ක්‍රමිකව ඒ ඒ යුගයන් හි දී රාජ්‍ය, ප්‍රභූ අනුග්‍රහය යටතේ සංවර්ධනයට ලක් වූ බවයි. පහත සඳහන් ආකාරයට පරමාකන්ද රජමහා විහාරය සඳහා තත්කාලීන රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය විහාරයෙන් හමුවන සෙල්ලිපි මූලාශ්‍රයන් තුළින් සනාථ වේ.

| අනුග්‍රහය දැක් වූ පුද්ගලයා | තනතුරු නාමය | අනුග්‍රහය දැක්වූ ආකාරය |
|---|---|---|
| පරුමක තිස | ගම්ප්‍රධානී | ලෙන් විහාරයක් කරවා පූජා කිරීම |
| පරුමක තිස දූට | ගම්ප්‍රධානී | ලෙන් විහාරයක් කරවා පූජා කිරීම |
| දමගුත | - | ලෙන් විහාරයක් කරවා පූජා කිරීම |
| තිස්ස | නාවික ප්‍රධානි | පොකුණක් ඉදිකිරීම |
| ප්‍රමුඛ තිස්ස | - | ඉම වාපි නම් වැවක් ඉදිකිරීම |
| ගාමිධෑඅභය මහරජ | රජු | අඡනගරයෙන් හා තවිරිකය නගරයෙන් අය කරන බදු විහාරයට පූජා කිරීම |
| කළයසිව | - | |
| නන්දිමිත්‍ර සෙන්පති | සෙනවි | ආරාම සංකීර්ණයක් පූජා කිරීම |

එම මාහැඟි සාධක නෂ්ඨ වීමට නිරාවරණය නොකරන අතර ම දැනට පවත්නා පුරාවිද්‍යාත්මක උරුමයන් මතු අනාගතයට ද සුරක්ෂිතව දායාද කරමින් පුරාවිද්‍යා උරුමයක් බවට පත් කිරීමත් එයට සාපේක්ෂව පුරාවිද්‍යාත්මක වටිනාකම් සඳහන් කරමින් විහාරයීය ඉතිහාසය ලේඛනගත කිරීමත් සිදු කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

මේධානන්ද, එල්ලාවල. (2004). ***වළගම්බා මහ රජ්ජුරුවෝ***, දයාවංශ ජයකොඩි සහ සමාගම, මරදාන.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2004). ***ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

Paranavithana, Senarath, ***Inscription of Ceylon - Volume 01.***